# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2008/31 - 2017 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2017.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 1/2012

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2017 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 1 දරන ධීවර මෙහෙයුම්වල දී උල් කරන ලද කූරු භාවිතා කිරීම තහනම් කිරීමේ නියෝග යනුවෙන් හැඳින්වේ.

2. කිසිදු තැනැත්තකු විසින් ස්පියර් තුවක්කුවක් භාවිතා කිරීම හෝ සන්තකයේ තබා ගැනීම හෝ දේශීය ධීවර බෝට්ටුවක් තුළ තබා ගැනීම නොකළ යුතු ය.

3. කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරය තුළ ස්පියර් තුවක්කු හෝ අතෙහි රඳවන උල් කරන ලද කූරු භාවිතා කරමින් ධීවර මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.

4. මෙම නියෝගවල -

''ස්පියර් තුවක්කු '' යන්නෙන්, උල් කරන ලද කූරකින් විද මසුන් ඇල්ලීමට භාවිතා කරන තුවක්කුවක් අදහස් වේ ;

''ශ්‍රී ලංකා ජල තීරය'' යන්න සඳහා 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ ඊට දී ඇති අර්ථය ම විය යුතු ය.

03 - 835

1A - PG 3431 — 2757 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*